# ලංකා ඉතිහාසය

## 7.1.3 ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

## ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල.

- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇතිවීම.

ප්‍රංශ විප්ලවවාදීන් විසින් 1791 වර්ෂයේ දී මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයක් එළිදක්වන ලදී. මූලික මිනිස් අයිතිවාසිකම් යනු ස්වභාවයෙන් ම මිනිසාට හිමිවිය යුතු අයිතීන් විනා පාලකයන් විසින් ලබා දිය යුතු දෙයක් නොවන බවට එමගින් අර්ථ දැක්විණ. මානව අයිතිවාසිකම් පිළිබඳ එම ප්‍රකාශනයේ පහත සඳහන් අදහස් දක්නට ලැබුණි.

I. සෑම මිනිසෙකු ම නිදහස් මිනිසෙකු ලෙස උපත ලබන බැවින් ඔවුන් සෑම දෙනාට ම සමාන අයිතිවාසිකම් හිමි විය යුතු බව

II. සෑම පුරවැසියෙකුට ම නීති සම්පාදනය කිරීමේ කාර්යයට සම්බන්ධ වීමට අයිතියක් ඇති බව

III. සෑම පුරවැසියෙකුට ම නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට හා කැමති ආගමක් ඇදහීමට අයිතියක් තිබිය යුතු බව

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා. ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූ නිදහස සමානාත්මතාව හා සහෝදරත්වය යන සංකල්පවලට ඉහත සඳහන් මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනයේ උපුටන තුන මගින් පිළිගැනීමක් ලැබිණි. ලොව පුරා සමාජ අසාධාරණකම්වලින් පීඩනයට පත්ව සිටි ජනතාවට මෙමගින් මහත් ආශිර්වාදයක් ලැබුණි. එබැවින් පසු කාලයේ දී ලෝකයේ බොහෝ රටවල් මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් ම නීතිගත කිරීමට පෙලඹිණි.

- වැඩවසම් ක්‍රමයේ ඉතිරිව තිබූ නෂ්ටාවශේෂ විනාශ කොට දමා ප්‍රවේණි දාසයන් නිදහස් කිරීම

විප්ලවයට පෙර රටේ ඉඩම් බොහෝමයක් වංශාධිපතිවරු සහ පල්ලිය සතුව පැවතිණි. ඒවායේ සේවය කරන ලද්දේ ප්‍රවේණි දාසයන් ය. නමුත් විප්ලවයෙන් පසු එම සියලු ම ඉඩම් පල්ලියට හා වංශාධිපතිවරුන්ට අහිමි වූ අතර ඒවා ගොවි ජනතාව අතර බෙදා දෙනු ලැබුණි. ප්‍රංශ යටත් විජිතවල සිටි සියලු වහලුන් නිදහස් කරන ලදි.

- ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටී ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට අඩිතාලම වැටීම

නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය යන විප්ලවයේ ආදර්ශ පාඨ හේතු කොට ගෙන අනාගතයේ දී යුරෝපය තුළ නව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සඳහා අවශ්‍ය පදනම මේ තුළින් සකස් කරන ලදි.

- ජාතික හැඟීම් උද්දීපනය කරනු ලැබීම

විප්ලවය තුළින් අත්කර ගත් ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීම සඳහා සිය ජීවිත පරදුවට තබා කටයුතු කිරීමට පොදු මහජනතාව තුළ ඉමහත් කැපවීමක් ඇතිවිය.

එමෙන්ම සමස්ත යුරෝපීය ජනතාව කෙරෙහි බලපෑ දීර්ඝ කාලීන ප්‍රතිඵල රැසක් ප්‍රංශ විප්ලවය නිසා ඇතිවිය. විදේශික පාලකයන්ගේ දූෂිත රාජාණ්ඩු ක්‍රම යටතේ මැසිවිලි නගිමින් සිටි අය ඒවාට විරුද්ධව නැගී සිටීම සඳහා ප්‍රංශ විප්ලවය මගින් පොලඹවනු ලැබී ය. ජනතාව පීඩාවට පත්කළ රාජාණ්ඩු බිඳ දැමීම සඳහා යුරෝපය පුරා නිරතුරුව කැරලි ඇතිවනු දක්නට ලැබුණි. ඔස්ට්‍රියාවේ පීඩිත පාලනයට එරෙහිව නැගීසිටි ඉතාලි හා ජර්මන් ජනතාව ජාතික එක්සත්කම ගොඩනගා ගැනීම මෙයට දැක්විය හැකි කදිම උදාහරණයකි.

- ප්‍රංශය තුළ අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහිවීම

ප්‍රංශ විප්ලවයට නායකත්වය දුන් පිරිස් විවිධ දේශපාලන මත දැරූ අය වූ හෙයින් විප්ලවයෙන් පසුව විටින් විට ආණ්ඩු මාරු වීම් කිහිපයක් සිදුවිය. 1789 සිට 1799 දක්වා වර්ෂ වල මෙම තත්වය දක්නට ලැබිණි. මෙම අස්ථාවර දේශපාලන න්‍යාය නිසා 1799 දී හමුදා නිලධාරියෙකු වූ නැපොලියන් බොනපාට් විසින් ප්‍රංශයේ බලය අල්ලා ගන්නා ලදි. ( ප්‍රංශ විප්ලවයෙන් උපන් දරුවා ලෙස සැලකනුයේ නැපෝලියන් බොනපාට් ය.) එතැන් සිට ප්‍රංශයේ බිහි වූයේ නව දේශපාලන තත්ත්වයකි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා. ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk